# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2462/29 - 2025 නොවැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2025.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 6/3/7/15/11/16.

*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ*

*යොමු අංකය* : 4-3/10/2020/MV/108.

මොරගහකන්ද / කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මොරගහකන්ද / කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජයට ඉඩම් අත්කර ගැනීම.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ඊ 407 ඇලගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇලගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2025.08.29 දින සම්මත කරන ලද කැ. සි. අංක 310225හි කලාප අංක 02 හා පත්‍ර අංක 01හි පහත සඳහන් කර ඇති ඉඩම් කොටස්:-

01. කැබලි අංක 01
ඉඩමේ නම: අලියාවැටුණුපිටිය; වර්තමාන ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0062

02. කැබලි අංක 02
ඉඩමේ නම: අලියාවැටුණුපිටිය; වර්තමාන ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් කියන අය: නාරංගෙදර මුදියන්සේ (මියගොස් ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.2232

03. කැබලි අංක 03
ඉඩමේ නම: අලියාවැටුණුපිටිය; වර්තමාන ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0569

04. කැබලි අංක 04
ඉඩමේ නම: අලියාවැටුණුපිටිය; වර්තමාන ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: නාරංගෙදර මුදියන්සේ (මියගොස් ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0354

05. කැබලි අංක 05
ඉඩමේ නම: අලියාවැටුණුපිටිය; වර්තමාන ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: නාරංගෙදර මුදියන්සේ (මියගොස් ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0069

1A - G 045753 – 13 (2025/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩම් කැබලි සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2025 දෙසැම්බර් මස 15 වැනි දින පෙ. ව. 9.30ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 දෙසැම්බර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**එස්. විජයකුමාර්,**
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2025 නොවැම්බර් මස 07 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0101